# <u>රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ</u>
# <u>ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවලට</u>
# <u>බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම</u>

**1.0** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 01ක් සඳහා නිලධරයන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

**3.0**. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිළධාරින් යටත් විය යුතු වේ.

**4.0 අවශ්‍ය සුදුසුකම්**

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.
(රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම්:-

(I) සිංහල /දෙමළ /ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) තුන (03) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

හා

(II) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාවෙන් සියළුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ) හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

(ඊ) වෘත්තීය සුදුසුකම්:-
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක තාක්ෂණ ක්ෂේත්‍රයේ (ප්‍රමාණ සමීක්ෂක) ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හය (06) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

(උ) වෘත්තීය සුදුසුකම්:-
ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

(ඌ) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**5.0 වැටුප් පරිමාණය :- රු. 30,140 - 10 x 350 - 11 x 370 - 10 x 560 -10 x 660 - 49,910/-**
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT 2 -2016 වැටුප් කේතය අදාළ වේ.)

**6.0 අයදුම් කිරීමේ ක්‍රමය**

(අ) මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත ප්‍රකාරව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් **2021.04.10** දින හෝ ඊට පෙර **රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර "ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම - 2021" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

2021 මාර්තු මස 25 දින

**ජේ.ජේ. රත්නසිරි**
**ලේකම්**
**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

ආදර්ශ අයදුම්පත්‍රය

## රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ
## ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම - 2021

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

අයදුම්කරන භාෂා මාධ්‍යය - ☐

සිංහල - 1 දෙමළ - 2 ඉංග්‍රීසි - 3

1 මුලකුරු සමඟ නම - ................................................

2 සම්පූර්ණ නම - ................................................

................................................

................................................

3 ජාතික හැඳුනුම්පත් අංකය - | | | | | | | | | | | | |

4 ස්ථිර ලිපිනය - ................................................

................................................

................................................

5 ස්ත්‍රී/ පුරුෂ භාවය - ☐ ස්ත්‍රී - 1 පුරුෂ - 0

6 උපන්දිනය - වර්ෂය | | | | | | මාසය | | | දිනය | | |

7 දුරකථන අංකය - | | | | | | | | | | | |

| | | | | | | | | | | |

8 අධ්‍යාපන සුදුසුකම් -

I අ.පො.ස. (සා/පෙළ) විභාගය -

විභාග අංකය : ..............................

වර්ෂය : .................... මාසය : ....................

| විෂයය | | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

| විෂයය | | ශ්‍රේණිය |
|---|---|---|
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

II අ.පො.ස. (උ/පෙළ) විභාගය -

විභාග අංකය : ..............................

වර්ෂය : .................... මාසය : ....................

| විෂයය | | ශ්‍රේණිය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

III වෘත්තීය සුදුසුකම් -

| ආයතනය | | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |

9 වෙනත් සුදුසුකම් - ...............................................................

...............................................................

...............................................................

10 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

11 අයදුම්කරුගේ සහතිකය :

ඇ. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

ආ. ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

ඇ. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ............................ ............................

අයදුම්කරුගේ අත්සන

## <u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ..................................................................මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ..............................දින මා ඉදිරිපිට දී ඔහුගේ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-

අත්සන :-

තනතුර හා නිලමුද්‍රාව :-

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධරයෙකු, රු.240,360/= වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධරයෙකු විසින් සහතික කර තිබිය යුතුය.)

**<u>රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා</u>**

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>**

.............................................................................................................................. මයා/මිය/මෙනෙවිය දැනට ............................................................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත .......................................................................වශයෙන් සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඇය/ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

.............................................................

දිනය :-

**දෙපාර්තමේන්තු ප්‍රධානී අත්සන**
**නිලමුද්‍රාව**